// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2378/40 – 2024 අප්‍රේල් මස 05 වැනි සිකුරාදා – 2024.04.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනත**

1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 31ආ වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලද ගරාඬුව කලපු ධීවර සංවර්ධන හා කළමනාකරණ සැලැස්ම.

ඩග්ලස් දේවානන්දා,
ධීවර අමාත්‍ය.

2024 මාර්තු මස 31 වැනි දින,
කොළඹ දී ය.

**ගරාඬුව කලපු ධීවර සංවර්ධන හා කළමනාකරණ සැලැස්ම**

ශ්‍රී ලංකාවේ පිහිටි කලපු 116 ක් අතරින්, මාතර දිස්ත්‍රික්කයේ පිහිටි ගරාඬුව කලපුවේ, පාරිසරික තත්වයන් තිරසාරව පවත්වා ගැනීමටත් එතුළින් කලපුව හා ඒ ආශ්‍රිතව සිදුකරන්නා වූ ජීවනෝපායයන් සුරක්ෂිත කිරීම හා වැඩිදියුණු කිරීම අරමුණු ඇතිව මෙම නීති රීති හා රෙගුලාසි, මූලධර්ම හා ක්‍රියාත්මක ක්‍රමවේදය ඇතුළත් ලියවිල්ල සම්පාදනය කොට ඇත.

මෙම සැලැස්ම ගරාඬුව කලපු සහ-සහභාගීත්ව කමිටුව විසින් අනුමත කොට ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමු කළ පසු මෙම සැලැස්ම පනතේ සඳහන් කාරණා හා ඇති අනුකූලතාව විමසා බලා ධීවර අමාත්‍යවරයාගේ අනුමැතියට යොමුකරනු ලැබේ. (31ආ වගන්තිය)

අමාත්‍යවරයා මගින් මෙම සැලැස්ම අනුමතකොට *ගැසට් පත්‍රයේ* පළකළ පසු මෙහි සඳහන් කාරණා ක්‍රියාත්මක තත්වයට පත්වේ. (31ආ. 4 වන උපවගන්තිය)

1A – PG6687– 604(2024/04)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

61 වන වගන්තිය යටතේ සුදුසු නියෝග සෑදීමෙන් සහ 34 වන වගන්තිය යටතේ සුදුසු නිවේදන පළකිරීම මගින් සැලසුමේ විධි විධානවලට අමාත්‍යවරයා විසින් බලාත්මකභාවයක් ලබාදිය යුතු ය. (31ආ. 5 වන උපවගන්තිය )

**01. ගරාඬුව කලපු කළමනාකරණ සහ-සහභාගීත්ව කමිටුව**

2013 අංක 35 දරන පනත මගින් සංශෝධිත 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 31අ වගන්තියට අනුව, ධීවර අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කරනු ලබන කමිටුව මින් මතු ගරාඬුව කලපු කළමනාකරණ සහ-සහභාගීත්ව කමිටුව යනුවෙන් නම් කරනු ලැබේ. (එහි සංයුතිය ඇමුණුම් අංක 01 යටතේ දක්වා ඇත) මෙම කමිටුව අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරයාගේ සභාපතීත්වයෙන් රැස්විය යුතු අතර දිස්ත්‍රික් ධීවර සහකාර අධ්‍යක්ෂ මෙම කමිටුවේ ලේකම්වරයා ලෙස කටයුතු කරනු ලැබේ.

**02. මූලධර්ම**

කලපු පරිසර පද්ධතියේ සම්පත් නෙළාගැනීම, භාවිතය සහ පරිභෝජනය සම්බන්ධ තීරණ පහත දක්වා ඇති මූලධර්ම, හර පද්ධතීන්ට අනුව කටයුතු කළ යුතු ය.

- සම්පත් සමානව බෙදී යාම
- නීතිගරුක බව
- සහ-සහභාගීත්වය
- විනිවිදභාවය
- පරිසරහිතකාමී බව
- කාර්යක්ෂමභාවය හා සඵලදායීත්වය
- වගවීම
- පොදු එකඟතාවය (ජාති, ආගම්,කුල,දේශපාලනික, වෘත්තීය බලය නොතකන ආදී වූ)
- ඵලදායී ප්‍රතිචාරය
- සාමූහිකත්වය

**03. ගරාඬුව කලපු කළමනාකරණ සහ-සහභාගීත්ව සැලැස්ම අදාළවන බල ප්‍රදේශය**

ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ගරාඬුව කලපු ජල තීරය හා ඊට යාබද හඳුනා ගන්නා ලද ග්‍රාම නිලධාරී වසම් 6 කට අයත් වන්නා වූ ගොඩබිම් තීරය (2013 අංක 35 දරන ධීවර හා ජලජ සම්පත් සංශෝධන පනතේ ධීවර කළමනාකරණ ප්‍රදේශ 31(1) වගන්තිය යටතේ අංක 1997/19 සහ 2016.12.15 වන දින *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශිත ගරාඬුව කලපු ධීවර කළමනාකරණ බල ප්‍රදේශය ලෙස හැඳින්වේ).

- භූගෝලීය වපසරිය - GPS දත්ත ඇතුළත් සිතියමක් මගින් ගරාඬුව කලපුව තුළ හඳුනා ගන්නා ලද බල ප්‍රදේශය පැහැදිළි කරනු ඇත. එය ඇමුණුම් අංක 02 යටතේ දක්වා ඇත.

- ගරාඬුව කලපුවේ හඳුනාගන්නා ලද ගොඩබිම් තීරයට මායිම් වන වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි වසම් 06 කි.

  1. මිරිස්ස උඩුමුල්ල - 405 B
  2. මිරිස්ස උඩුපිල - 405 A
  3. බංඩාරමුල්ල - 407 A
  4. තල් අරඹ උතුර - 407 D
  5. තල් අරඹ නැගෙනහිර - 407 C
  6. ගරාඬුව - 408 B

**04. ආයතනික ව්‍යුහය**

**ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය**

ගරාඬුව කලපුව තුළ ධීවර කර්මාන්තයේ නියුතු කලපු ධීවරයින් ඇතුළත් කලපු ධීවර කළමනාකරණ කමිටු 01 කි. (1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 32 වගන්තියේ 3 වන උපවගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ධීවර කමිටු ප්‍රකාශයට පත්කිරීමේ අංක 2027/33 සහ 2017.07.13 වන දින දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රය* ඇමුණුම 03 යටතේ දක්වා ඇත.)

| ධීවර කමිටුවේ නම | ලියාපදිංචි අංකය |
|---|---|
| 1.1 ගරාඬුව කලපු ධීවර කළමනාකරණ කමිටුව | ධීජදෙ/ධී.කමිටු/ග.ක./01 |

1. ගරාඬුව කලපුව තුළ ක්‍රියාත්මක වන ගරාඬුව කලපු කළමනාකරණ කමිටුව ධීවර සාමාජිකයින් 30 දෙනෙකුගෙන් සමන්විත වන්නේ ය.

2. එම කමිටුවේ විධායක සභාව (නියෝජිතයින් 11 දෙනෙකු) මසකට වරක් රැස්වේ.

3. කලපු ධීවර කමිටුවේ මහ සභාව මාස දෙකකට වරක් අවසන් මාස පෝය දින රැස්වේ.

4. කලපු ධීවර කමිටුවේ වාර්ෂික මහාසභාව සෑම වසරකම දෙසැම්බර් මාසයේ දී පවත්වනු ලැබේ.

5. 1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනතට අනුකූලව 2013 අංක 35 දරන ධීවර හා ජලජ සම්පත් සංශෝධන පනතේ ප්‍රතිපාදනයන්ට අනුව ගරාඬුව කලපුව සඳහා සහ-සහභාගීත්ව කමිටුවේ සංයුතිය ඇමුණුම් අංක 01 යටතේ දක්වා ඇති පරිදි නිලධාරීන් හා ආයතනවලින් සමන්විත වන්නේ ය.

6. ගරාඬුව කලපු සහ-සහභාගීත්ව කමිටුව සෑම මාස 03 කට වරක් පැවැත්වෙන අතර දිස්ත්‍රික්කයේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තු සහකාර අධ්‍යක්ෂවරයා එහි කැඳවුම්කරු ලෙස ක්‍රියාකරන අතර දිස්ත්‍රික් ලේකම්වරයාගේ සභාපතීත්වයෙන් එය පැවැත්වේ.

7. අත්‍යාවශ්‍ය අවශ්‍යතාවයක දී එම කමිටුව නියමිත කාලයට පෙර රැස්විය යුතු ය.

**05. තීරණ ගැනීමේ ක්‍රමවේදය**

1. කලපුවේ ජලජ ජීවී සම්පත් නෙළා ගැනීම, භාවිතය හා පරිභෝජනය සම්බන්ධයෙන්, තීරණ ගැනීමේ ක්‍රියාවලිය කලපු ධීවර කළමනාකරණ කමිටු හා ගරාඬුව සහ-සහභාගීත්ව කළමනාකරණ කමිටුව විසින් මෙම සැලැස්ම තුළ හඳුනාගෙන ඇති මූලධර්ම හා එකගත්වයන්ට යටත්ව සිදු කළ යුතු ය.

2. ගරාඬුව කලපු සහ-සහභාගීත්ව කළමනාකරණ කමිටු සභාපති ලෙස මාතර දිස්ත්‍රික් ලේකම්තුමා/තුමිය කටයුතු කරනු ලැබේ.

3. කලපුව තුළ ධීවර මෙහෙයුම් කිරීම පිළිබඳ කලපු ධීවර කළමනාකරණ කමිටු අධීක්ෂණය කළ යුතු ය. එහි දී යම් විසඳාගත නොහැකි කරුණු මතු වුවහොත් එය ගරාඬුව සහ-සහභාගීත්ව කළමනාකරණ කමිටුව වෙත යොමු කළ යුතු ය.

4. ගරාඬුව කලපු සහ-සහභාගීත්ව කළමනාකරණ කමිටුව සඳහා, කලපු ධීවර කළමනාකරණ කමිටුවෙහි යෝජනා ඉදිරිපත් කිරීමේදී ඉදිරිපත් කළ යුතු යෝජනා සම්බන්ධව කලපු ධීවර කළමනාකරණ කමිටුව විසින් බහුතර අනුමැතියෙන් යෝජනා ස්ථිර කොට ගරාඬුව සහ-සහභාගීත්ව කළමනාකරණ කමිටුව නියෝජනය කරන සාමාජිකයින් විසින් ගරාඬුව සහ-සහභාගීත්ව කළමනාකරණ කමිටුවේ සංවාදයට හා තීරණ ගැනීමට ලක්කළ යුතු ය.

5. ගරාඬුව සහ-සහභාගීත්ව කළමනාකරණ කමිටුවේ තීරණය සඳහා, ගරාඬුව කලපු ධීවර කළමනාකරණ කමිටුව විසින් ඉදිරිපත් කරන යෝජනා හා අනෙකුත් පාර්ශවකරුවන්ගේ ඉදිරිපත්වන යෝජනා ගරාඬුව සහ-සහභාගීත්ව කමිටුව තුළ (අංක 05.1) යටතේ දක්වා ඇති මූලධර්මයන්ට අනුව සාකච්ඡාවට ගත යුතු ය.

6. කලපු ධීවර පරිසර පද්ධතියට බලපෑම් කරන ආකාරයේ සංවර්ධන යෝජනාවක් ඉදිරිපත් කිරීමේදී හෝ ක්‍රියාත්මක කිරීමේදී ගරාඬුව සහ-සහභාගීත්ව කළමනාකරණ කමිටුව විසින්, අදාළ ව්‍යාපෘතියට අදාළව මධ්‍යම පරිසර අධිකාරියේ පාරිසරික තක්සේරු වාර්තාවක් (EIA/IEE) ලබා ගන්නා ලෙසත් ඉන් පසු අදාළ වාර්තාවේ සඳහන් නිර්දේශ සැළකිල්ලට ලක්කිරීමෙන් පසු අදාළ යෝජනාව විද්වත් මණ්ඩලයක නිර්දේශයට ඉදිරිපත් කළ යුතු ය.

7. ගරාඬුව කලපු සහ-සහාභාගිත්ව කමිටුවට ඉදිරිපත් වන යෝජනා පිළිබඳ තීරණ ගැනීමට නොහැකි අවස්ථාවක් උදාවුවහොත් ඒ පිළිබඳ තීරණ ගැනීම සඳහා සහ-සහභාගීත්ව කමිටුව විසින් ජාතික මට්ටමේ අදාළ විෂය සම්බන්ධව කටයුතු කරන ආයතන වල මතය විමසා බලා තීරණ ගත හැකි වන්නේ ය.

8. ගරාඬුව සහ-සහභාගීත්ව කළමනාකරණ කමිටුව විසින් කලපුවට අදාළ සංවර්ධන සැලැස්මක් සකසා ගත යුතු අතර එම සංවර්ධන සැලැස්ම ක්‍රියාවට නංවමින්, අධීක්ෂණය, නියාමනය හා පසුවිපරම් කිරීම සඳහා ගරාඬුව සහ-සහභාගීත්ව කළමනාකරණ කමිටුව කටයුතු කළ යුතු ය.

**06. කලපුවේ ආරක්ෂිත ස්වාභාවික සම්පත්**

- කලපු කළමනාකරණ බලසීමාව තුළ ඇති ගොඩබිම් තීරය/ කලපු ජලය/ මත්ස්‍යයින්, පක්ෂීන් එහි ඇති ජලජ සම්පත් සහ අනෙකුත් ජලජ ජීවීන් සහ හඳුනාගන්නා ලද දූපත ද ඇතුළුව කඩොලාන පරිසර පද්ධතියේ ඇති සියළුම ශාක ප්‍රජාවන් ගරාඬුව කලපුව අයත් ස්වාභාවික සම්පත් ලෙස නම් කෙරෙනු ඇත.

- කඩොලාන ආශ්‍රිත ප්‍රදේශ, කලපු බල ප්‍රදේශය GPS ඛණ්ඩාංක සලකුණු කිරීමේ අවස්ථාවේදී හඳුනාගෙන එම ප්‍රදේශය පාරිසරික සංවේදී ප්‍රදේශයක් ලෙස නම් කරනු ඇත.

- ජලජ ජීවීන් අභිජනනය වන විශේෂිත ස්ථාන හඳුනාගෙන එම ස්ථාන හා සීමාවන් මත්ස්‍ය අස්වනු නෙළීමට තහනම් කලාප ලෙස නම් කරනු ඇත.

- ආහාරයට ගන්නා මසුන් හැර අනෙකුත් සියලුම ජීවී හෝ අජීවී සම්පත් ගරාඬුව සහ-සහභාගීත්ව කළමනාකරණ කමිටුවේ අවසරයකින් හෝ අනුමැතියකින් තොරව පර්යේෂණය කිරීම / අත්පත්කරගැනීම / විනාශ කිරීම / ගොඩකිරීම යන කාරණා ගරාඬුව කලපු ධීවර කළමනාකරණ සැලැස්ම උල්ලංඝනය කරන කාරණා ලෙස සැලකෙන අතර එවන් කිසිදු ක්‍රියාවක් කලපු සීමාව තුළ හා රක්ෂිත ප්‍රදේශ තුළ සිදු නොකළ යුතු ය.

- කලපුවට ජලය පැමිණෙන ඇළ මාර්ග රක්ෂිතය, ඇල ඉවුරේ සිට එක් පසකට අවම මීටර් 05 ක් බැගින් විය යුතු ය.

**07. ගරාඬුව කලපුව තුළ යෝග්‍ය ක්‍රියාකාරකම් හා සීමාවන්**

1. ගරාඬුව කලපු ධීවර කළමනාකරණ කමිටුවේ ලියාපදිංචි ධීවරයින් උපරිම වශයෙන් 30කට පමණක් කලපුව තුළ ධීවර කර්මාන්තයේ නියැලීමට අවසරය ලැබේ.

2. ගරාඬුව කලපු ධීවර කර්මාන්තයේ නියුතු සෑම ධීවරයකුම තමන්ට ඔරුවක් අයත් නම් එම ඔරුව ධීවර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරවා ගතයුතු අතර අදාළ ලියාපදිංචි අංකය පැහැදිළිව පෙනෙන සේ ඔරුවේ සටහන් කර තිබිය යුතු ය.

3. ලියාපදිංචි සෑම ධීවරයෙකුටම කලපුව තුළ එළන දැල් භාවිතා කළ හැකිවන්නේ දවසේ පස්වරු 6.00ත් පෙරවරු 8.00ත් අතර කාල සීමාව තුළ පමණක් වන අතර එම එක් අවස්ථාවක් තුළ එළිය හැක්කේ උපරිම දැල් මීටර් 300ක් පමණි. (දැල් පීස් 06ක් පමණි) අවම සීමාව කලපුවේ මත්ස්‍ය අස්වනු ප්‍රමාණය අඩු වන විට කලපු ධීවර කළමනාකරණ කමිටුව විසින් තීරණය කරනු ඇත.

4. වර්ෂය පුරාම සියළුම මත්ස්‍ය වර්ග වෙනුවෙන් එලන දැල් භාවිතා කළ හැකි අවම ඇස් සීමාව අඟල් 3-3 ½ වේ.

5. ගරාඬුව කලපු ධීවර කළමනාකරණ කමිටුව ලියාපදිංචි ධීවරයන් සඳහා වර්ෂය පුරා කලපුව තුළ විසිදැල් භාවිතා කිරීමට හැකි වන්නේය.

6. ගරාඬුව කලපුව තුළ ධීවර මෙහෙයුම් සඳහා උපරිම ලියාපදිංචි ඔරු 10 ක් පමණක් භාවිතා කළ හැකි වන්නේ ය.

ගරාඬුව කලපුව තුළ ධීවර කර්මාන්තයේ යෙදිය හැකි පන්න ක්‍රම වනුයේ,

1. දැල් එළීම
2. විසිදැල් ගැසීම
3. බිලිබෑම

**08. ගරාඬුව කලපුව තුළ තහනම් ක්‍රියාකාරකම්**

1. ධීවර පන්න ක්‍රම සඳහා තංගුස් දැල් භාවිතා කිරීම සපුරා තහනම් වන්නේ ය.

2. සියළුම යාන්ත්‍රික බෝට්ටු සහ යාන්ත්‍රික ඔරු කලපුව තුළ යාත්‍රා කිරීම සපුරා තහනම් වන්නේ ය.

3. ජලය මතුපිට ගොඩබෑමට හැකි ගුවන්යානා කලපුව තුළට ඇතුල් කිරීම සපුරා තහනම් වන්නේ ය.

4. කලපුව තුළ,
   - දැල් එළා වතුරට තැලීම සහ මාළුන් බිය වැද්දවීම.
   - අතන් ගෑම
   - මඩ මිරිකා ඉස්සන් ඇල්ලීම.
   - මාලුවන්ට ඇනීම(කම්බි කුරුවලින් සහ උල් ආයුධ වලින්)
   - දැල් කූඩු යොදා මසුන් ඇල්ලීම සහ ධීවර පනත තුලින් හඳුනාගෙන ඇති තහනම් පන්න ක්‍රමද භාවිතා කිරීම සපුරා තහනම් වන්නේ ය.

5. දවසේ පෙරවරු 8.00 සිට පස්වරු 6.00 දක්වා කලපුව තුළ දැල් එළීම සපුරා තහනම් වන්නේ ය.

6. රාත්‍රී කාලයේ දී මාළුන් සඳහා විසිදැල් ගැසීම සපුර තහනම් වන්නේ ය.

7. කලපුවේ ජලය මතුපිට හා ගොඩබිම් රක්ෂිතය තුළ කිසිඳු තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීමක් හෝ ගොඩකිරීමක් සඳහා භාවිත නොකළ යුතු ය.

8. කලපු මත්ස්‍ය සම්පත ලියාපදිංචි සියළුම ධීවරයන්ගේ පොදු සම්පතක් සේ සලකා කලපුව කොටස්කර අයිතිකර ගැනීමට කිසිඳු අයිතියක් නැත්තේ ය.

9. ගරාඬුව කලපු සහ-සහභාගීත්ව කළමනාකරණ සැලැස්මේ හඳුන්වාදෙන කාරණා උල්ලංඝනය කළ විට,

- කලපුවේ ධීවර කටයුතුවලට අදාලව මෙම සැලැස්ම තුළ ඇති කාරණා උල්ලංඝනය කළවිට, කලපු ධීවර කළමනාකරණ කමිටුව විසින් පත්කර ගත් කණ්ඩායමක් විසින් නීති හා එකඟතාවයන් කඩකරන පුද්ගලයින් හඳුනා ගෙන පළමුව දැනුවත් කළ යුතු අතර ඒ සම්බන්ධව ධීවර දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුවත් කළ යුතු ය. දිගින් දිගටම අදාල එකඟතාවයන් කඩකරන පුද්ගලයින් හා ආම්පන්න සම්බන්ධව ධීවර පනත හා මෙම සැලැස්ම අනුව ධීවර දෙපාර්තමේන්තු නිලධාරීන් මගින් නීතිමය කටයුතු සඳහා යොමු කළ යුතු ය.

- කලපුව තුළ ධාවනය වන යාන්ත්‍රික බෝට්ටු, කඩොලාන කැපීම, කලපුව ගොඩකිරීම , කලපුව තුළ සිදුකරන ඉදිකිරීම් සම්බන්ධව ඉහත සඳහන් කොන්දේසි කඩකරන පුද්ගලයින්ට හා ආයතනයන්ට එරෙහිව ඕනෑම පුද්ගලයෙකුට හා ආයතනයක් විසින් වැලිගම පොලීසිය වෙත පැමිණිලි කළ හැකි වන්නේය. ඒ සමගම එවන් පැමිණිලි ලිඛිතව ගරාඬුව සහ-සහභාගීත්ව කමිටුවේ ලේකම් හා සභාපති වෙත යොමු කළ යුතු වන්නේ ය.

**09. ගරාඬුව කලපු සහ-සහභාගීත්ව සැලැස්ම සඳහා සංශෝධන ඉදිරිපත් කිරීම**

- කලපු ධීවර කළමනාකරණ කමිටුවේ මහ සභාව තුළදී 2/3ක බහුතර ඡන්දයෙන් ගනු ලබන තීරණ හා නියෝග සහ-සහභාගීත්ව කමිටුවට ඉදිරිපත් කළ යුතු ය.

- සහ-සහභාගීත්ව කමිටුව විසින් රැස්වන වාරයන් වලදී ගන්නා නියෝග වසර අවසානයට ධීවර අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකළ යුතු අතර, එලෙස ලැබෙන යෝජනා ධීවර අධ්‍යක්ෂ ජනරාල් මගින් ධීවර නියෝග මාලාව සඳහා ඉදිරිපත් කළයුතු වන්නේ ය.


ඇමුණුම - 01

1. දිස්ත්‍රික් ලේකම්
2. දිස්ත්‍රික් සහකාර ධීවර අධ්‍යක්ෂ
3. දිස්ත්‍රික් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව - නිලධාරීන් දෙදෙනෙකු
4. ගරාඬුව කලපු ධීවර කළමනාකරණ කමිටුව වෙනුවෙන් සාමාජිකයින් 04 දෙනෙක්
5. ප්‍රාදේශීය ලේකම් - වැලිගම
6. සභාපති - ප්‍රාදේශීය සභාව - වැලිගම
7. නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරියෙකු
8. පළාත් ධීවර අධ්‍යක්ෂවරයා
9. වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තු නිලධාරියෙකු
10. නාරා ආයතන නිලධාරියෙකු
11. ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ නිලධාරියෙකු
12. මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරියෙකු
13. වනජීවී සංරක්ෂක දෙපාර්තමේන්තු නිලධාරියෙකු
14. වන සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරියෙකු
15. සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරියේ නිලධාරියෙකු
16. ඉඩම් අමාත්‍යංශ නිලධාරියෙකු
17. පොලිස් දෙපාර්තමේන්තු නිලධාරියෙකු
18. වෙරළ ආරක්ෂණ දෙපාර්තමේනතු නිලධාරියෙකු
19. ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිලධාරියෙකු

පනත අනුව, කමිටුවට අවශ්‍ය වෙනත් ඕනෑම ආයතන යටතේ

20. වාරිමාර්ග දෙපාර්තමේන්තු නිලධාරියෙකු
21. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු නිලධාරියෙකු
22. ප්‍රදේශයේ ප්‍රජා සංවිධාන - ගරාඬුව කලපුව සුරැකීමේ සංවිධානයේ නියේජිතයන් දෙදෙනෙකු
23. ගරාඬුව කලපුව අවට ගොවි සංවිධාන නියෝජිතයින් දෙදෙනෙකු (උඩුපිල/උඩුමුල්ල)
24. ඉඩම් පරිහරණ දෙපාර්තමේන්තු නිලධාරියෙකු
25. දිස්ත්‍රික් ක්‍රම සම්පාදන කාර්යාලයේ නිලධාරියෙකු.

ඇමුණුම - 02


GARANDUWA KALAPUWA
Scale 1:12,000
Garanduwa Kelapuwa
SEA
A2
SOUTHERN PROVINCE
Legend
Important Place
Railway
Main Road
Secondary Road
Track
Foot Path
Bund / Dam
Channel
River / Stream / Canal
Tank
Compiled Using 10,000 Database.
Prepared by Survey Department of Sri Lanka, Special Mapping Unit - 2016.

ඇමුණුම - 03

## 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත

1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 32 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කරනු ලබන නිවේදනය.

### නිවේදනයයි

අංක 1997/19 සහ 2016.12.15 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශිත ගරාඩුව කලපුව ධීවර කළමනාකරණ ප්‍රදේශයේ පහත සඳහන් ධීවර කළමනාකරණ කමිටුව පිහිටුවා ලියාපදිංචි කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| ධීවර කළමනාකරණ කමිටුවේ නම | ලියාපදිංචි අංකය |
|---|---|
| 1. ගරාඩුව කලපු ධීවර කළමනාකරණ කමිටුව | ධීජදෙ/ධී.කමිටු/ග.ක./01 |

එම්. සී. එල්. ප්‍රනාන්දු,
අධ්‍යක්ෂ ජනරාල්,
ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව.

2017 ජුලි මස10 වැනි දින.
ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව,
නව මහ ලේකම් කාර්යාලය, මාළිගාවත්ත,
කොළඹ 10.

EOG 04 - 0049

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.